# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව


නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

## 2 ශ්‍රේණිය - පරිසරය( ඔක්තෝබර්-2 සතිය)


### 13 තේමාව - එළිය සමඟ සෙල්ලම්.

- දුවේ පුතේ, වැඩිහිටියන්ගේ ද උදවු ඇතිව විශාල කාඩ්බෝඩ් පෙට්ටියක් හෝ ආවරණයක් හෝ කොළයක්, ස්ථානයක්ද, විදුලි බල්බයක් ද සපයා ගන්න.
- විදුලි පන්දම දල්වා, එමඟින් ආලෝකය විහිදෙන ආකාරය බලන්න.
- විදුලි පන්දමේ හිස කොටස ගලවා, බල්බය දල්වා විහිදෙන එළිය දෙස බලන්න.
- දුවේ පුතේ දැන් සමාන ප්‍රමාණයේ සමචතුරස්‍රාකාර කඩදාසි කිහිපයක් ගන්න.
- ඒවායේ හරිමැද සිහින් සිදුරක් සාදාගන්න.
- ඒවායින් විවිධ ප්‍රමාණයේ ගොටු සකස් කරගන්න.
- එක් එක් ප්‍රමාණයේ ගොටු තුළට විදුලි පන්දම ඇතුළු කර, ආලෝකයේ විහිදීම බලන්න. සතුටුවන්න. ඔබ දුටු දේ චිත්‍රයට නඟන්න.




❖ දුවේ පුතේ, අපි ලස්සන පහන් කූඩුවක් හදමු.

- බ්‍රිස්ටල් බෝඩ්වලින් එක ම ප්‍රමාණයේ සමචතුරස්‍රාකාර හැඩ 4ක් කපා ගන්න.
- එම කොටස් හතරෙහිම එක් පැත්තකින් පහත දැක්වෙන ආකාරයට කොටසක් නවා ගන්න.



- දුවේ පුතේ දැන් කඩදාසිවල මැදින් ඔබ කැමති හැඩතලයක් කපා ඉවත් කරන්න.
- ඉවත් කළ කොටසේ ඇතුල් පැත්තෙන් සෙලෝපේන් කඩදාසි අලවන්න.



- පහන් කූඩුවේ උඩු පැත්තෙන් එය රැඳවීමට නූලක් එල්ලන්න.
- යට කොටසට රැළි කපා අලවා අලංකාර කරන්න.
- දැන් පහන් කූඩුවට ආලෝකය ලබාදෙන්න. සතුටුවන්න. ඔබ සෑදූ පහන් කූඩුව චිත්‍රයට නඟන්න.